**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට **කඹුරුපිටිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂය වෙනුවෙන් ගෙවන ලද කර්මාන්ත ඉදිකිරීම් වියදම් රු.1,381,095 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය ලෙස ගිණුම්ගත කර තිබුණි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබූ කර්මාන්ත වියදම් රු.449,625 ක් සමාලෝචිත වර්ෂයේදී ණයහිමියන් යටතේ ගෙවා තිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද රු.10,108,692 ක් ප්‍රාග්ධන වැය ලෙස ගිණුම් ගත නොකර ණය හිමියන්ගෙන් ගෙවා තිබුණි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සභාවට අයත් අම්බලම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.97,108 ක විදුලි බිල්පත් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා නිවැරදිව ප්‍රතිපාදනය කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබිය යුතු රු.948,988 ක ආධාර මුදල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය සඳහා ගෙවන ලද විගණන ගාස්තු රු. 124,200 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේදී රු.182,290 ක් වැය කර මිලදී ගත් උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,345,500 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.141,617,063 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 74,340,617 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂවල සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු.1,168,845 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට තොරතුරු නොමැත. |

### (ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.192,990,711 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ලේඛනවල දුර්වලතාවයන් මගහරවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ, වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | පරිපූරක අයවැයක් සකස් කර නැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවූ රු.2,141,971 ක් වටිනා තැන්පතු නියාදනය කිරිමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු නියාදනය කිරීම සඳහා අදාළ පුද්ගලයන්ට සිහි කැඳවීම් ලිපි යවමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 09 න් 05 ක 2018 වර්ෂයේ දෛනික ධාවන සටහන් 2019 පෙබරවාරි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය. | රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදි නිවැරදි පරිදි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/801 දරන විදුලි හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය. | චක්‍රලේඛ ප්‍රකාරව වීථි ලාම්පු ස්ථාපනය නොකිරීම නිසා සභා අරමුදලෙන් දරන ලද රු.1,562,171 ක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | අනුමත වීථි පහන් සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා විදුලි බල මණ්ඩලයට දන්වා යවා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,301,021 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.13,229,118 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,279,258 | 2,626,520 | 2,419,218 | 1,526,942 | 1,500,753 | 1,989,885 | 1,818,934 | 1,319,640 |
| කුලී | 7,334,109 | 6,726,806 | 7,373,009 | 1,007,498 | 6,804,527 | 6,768,502 | 6,159,783 | 1,653,701 |
| බලපත්‍ර ගාස්තු | 982,450 | 1,679,271 | 1,664,671 | 100,395 | 857,000 | 1,413,330 | 1,406,630 | 85,795 |
| වෙනත් ආදායම් | 6,730,000 | 26,713,512 | 11,857,099 | 69,857,079 | 20,298,692 | 22,645,674 | 14,114,191 | 55,018,666 |
| එකතුව | 17,325,817 | 37,746,109 | 23,313,997 | 72,509,914 | 29,460,972 | 32,817,391 | 23,499,538 | 58,077,802 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.17,325,817 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.58,077,802 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.37,746,109 ක් සමඟ රු.95,823,911 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.23,313,997 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.72,509,914 ක් විය. ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 24 කි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට සහ ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. ඇතැම් ආදායම් අයකර ගැනීමේ දී අධිකරණ නියෝග ප්‍රකාරව දීර්ඝ කාලීනව කොටස් වශයෙන් අයකරමින් පවති. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.999,597 ක් වූ අතර, රු.1,328,445 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.2,328,042 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.1,128,447 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,199,595 ක හිඟ ශේෂයක් පැවතුණි. වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය හා වර්ෂයේ බිල්කිරීම්වලින් අයවීම් සියයට 48 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් අයකර ගැනීමට හා ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා දේපළ තහනම් කිරීමට කටයුතු කරමින් පවති. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.320,043 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.24,407 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.17,103 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.327,347 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අයවීම් වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් හා වර්ෂයේ | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | නිශ්චිතව හඳුනාගත් හිඟ අක්කර බදු හිමිකරුවන් වෙත සිහිකැඳවීම් කර ඇත. |

බිල්කිරීම්වලින් සියයට 5 ක් තරම් අවම මට්ටමක පැවතුණි.

## 2.2.4 කුලී

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු.1,653,701 ක් වූ අතර, රු.6,839,872 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමඟ රු.8,493,573 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.7,486,076 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.1,007,497 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ ශේෂය අය කර ගැනීමට නීතිමය වශයෙන් කටයුතු කරන අතර, නඩු පවරන ලද බදුකරුවන්ගෙන් නඩු තීන්දු අනුව වාරික වශයෙන් දිගු කාලීනව අයකර ගනු ලැබේ. |
| **(ආ) බලපත්‍ර ගාස්තු** | | |
| ආරම්භක හිඟය රු.85,795 ක් වූ අතර, රු.1,100,390 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමඟ රු.1,186,185 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,085,790 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.100,395 ක හිඟ ශේෂයක් පැවතුණි. වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් හා වර්ෂයේ බිල්කිරීම්වලින් අයවීම් සියයට 91 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ ශේෂය නිරවුල් කිරීමට හා කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

## 2.2.5 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.1,412,877 ක් හා මුද්දර ගාස්තු රු.31,669,220 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදල් ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙතින් ඉල්ලීම් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථාව** | | |
| | 2013 ඔක්තෝම්බර් 25 දිනැති අංක 1834 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික තත්ත්වයේ දී ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදු වී ඇත. |
| (ආ) | **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| | සමාලෝචිත වර්ෂයේදී කසළ බැහැර කිරීම සඳහා රු.4,643,250 ක වියදමක් දරා තිබූ අතර දෛනිකව එක්රැස් කරන කසළ වර්ගීකරණයකින් තොරව අවිධිමත් ලෙස කඹුරුපිටිය නගරයේ පොළ පිටුපස පිහිටි ඉඩමට බැහැර කරමින් තිබීම නිසා අවට ප්‍රදේශයේ දුර්ගන්ධය පැතිර යාම හා පරිසරය දූෂණය වීමෙන් නොයෙකුත් ලෙඩ රෝග පැතිරයාමේ අවධානමක් පවතී. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතුවේ. | සුදුසු භූමියක් ලැබුණු පසු කසළ බැහැර කිරීම විධිමත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. කසළ බැහැර කිරීම නිසා ඇතිවන ගැටළු මගහරවා ගැනීමට කෙටි කාලීන විසඳුම් ගන්නා අතර ම දීර්ඝ කාලීන විසඳුමක් වශයෙන් කසළ දහන යන්ත්‍රයක් මිල දී ගැනීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. |
| (ඇ) | **තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| | තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | 2030 න්‍යාය පත්‍ර ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි කටයුතු පිළිබඳව කිසිදු නිළධාරියෙකු දැනුවත් වී නොමැත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 04 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සහ අතිරික්ත විධිමත් කළ යුතුවේ. | විධිමත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු.62,126 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | විශ්‍රාම වැටුපෙන් අයකර ගත හැකි සේවක ණය අයකර ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් දැනුවත් කිරීමට කටයුතු කරමි. |

## 3.3 වත්කම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ධාවනයෙන් ඉවත් කර තිබූ කැබ් රථයක්, අත්ට්‍රැක්ටරයක්, ට්‍රේලර් 02 ක් සහ යතුරු පැදියක් වත්කම් කළමනාකරණය පිළිබඳ 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරණ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණ කටයුතු සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරන කටයුතු කඩිනමින් කළ යුතුවේ. | නිර්දේශ ලද වහාම අදාළ වත්කම් අපහරණය කිරීමට කටයුතු කරමි. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී දක්ෂිණ සංවර්ධන වැඩසටහන යටතේ බිබුලේවෙළ මාර්ගයේ කුට්ටිගල් ඇතිරීම සඳහා රු.826,741 ක් වැයකර තිබුණ නමුත් ඉදිකිරීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම නිසා මෙම මාර්ගය එක් ප්‍රතිලාභියෙකු පමණක් භාවිතා කරනමින් පැවතුණි. | ඉදිකිරීමට පෙර පූර්ණ ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුවේ. | ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් මාර්ගය අවසානය දක්වාම කුට්ටිගල් අතුරා මාර්ගය සංවර්ධනය කිරීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාව සතු මාර්ගවල සංඥා පුවරු සකස් කිරීම සඳහා රු.1,530,000 ක් වැයකර තිබුණද, නියැදි පරීක්ෂාවේදී මාර්ග නාමපුවරු සැකසීමට වලවල් හැරීම, කොන්ක්‍රීට් කිරිම, සංඥා පුවරු සවිකර ඇති කණුවල උස හා දැන්වීම් පුවරුවේ වර්ග මීටර් ප්‍රමාණය යන අයිතම නිමිවැඩ වාර්තාවේ සඳහන් ප්‍රමාණයට වඩා අඩුවෙන් නිමකර තිබුණි. | ඉටු කළ වැඩ කොටස්වල ප්‍රමාණයට ගෙවිය යුතුවේ. | මාර්ග නාම පුවරු වල පිරිවිතරයන්ට අදාළ අඩුපාඩු සකස් කිරීමට සටහන් තබා ගතිමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයන් 07 ක රු.11,196,010 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 15 සිට සියයට 57 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | අයවැය ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |